# අජන්තා ලෙන්හි වියන් සිතුවම්වල ශෛලිය සහ ආකෘතික ලක්ෂණ

බණ්ඩාරනායක මුදියන්සේලාගේ අමාලි රසාංගිකා[1]

අජන්තාවෙහි සිතුවම් නිර්මාණ අතර බිතු සිතුවම් සහ වියන් සිතුවම් වශයෙන් දෙවර්ගයකට අයත් සිතුවම් හඳුනාගත හැකි ය. අජන්තා ලෙන්හි සිවිලිම් සිතුවම්වල ශෛලිය සහ ආකෘතික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. අජන්තා ශිල්පියා බිතුසිතුවම් සඳහා වස්තු විෂයයන් තුනක් තෝරාගෙන ඇත. එනම්, ජාතක කතා, බුද්ධ චරිතයේ සිද්ධි හා ඓතිහාසික සිද්ධි ය. අජන්තා චිත්‍ර බොහෝ දුරට ලෝකෝත්තර තේමා මුල් කරගෙන ඇඳ ඇති බව පෙනේ. ඓතිහාසික සිද්ධි අතර සුළු චිත්‍ර ප්‍රමාණයක් ලෞකික තේමා මත ඇඳ ඇති අවස්ථා ද හමු වේ. ඉහතින් දැක් වූ වස්තු විෂයන්හි කතා වස්තුවල දැක්වෙන අවස්ථෝචිත අදහස් ප්‍රකාශන ශක්තිය අතිශයින් ම ප්‍රබල ය. බිතු සිතුවම්වලට වඩා වෙනස් වූ සිතුවම් නිර්මාණ ලෙස වියන්තල සිතුවම් හැඳින්විය හැකි ය. 17 වැනි ලෙන් විහාරයේ ආලින්දයේ සිවිලිම අලංකාර කර ඇත්තේ මෝස්තරානුසාරයෙනි. මෙහි රූ කම් සඳහා මුල් වී ඇත්තේ බොහෝ දුරට මල් ලියකම් මෝස්තර යි. ශාලාවෙහි සිවිලිම මිථ්‍යා රූපවලින් අලංකාර කර ඇත. අංක 19 වැනි චෛත්‍ය ශාලාවේ වු සිවිලිම ද අලංකාර රූකම් කරණයෙන් විචිත්‍රවත් වී ඇත. මෙහි ප්‍රදක්ෂිණාපථයේ වූ සිවිලිම ද සිතුවම් අතින් විශිෂ්ට පෙනුමක් ලබාදෙයි. සතුන්ගේ රූප, මල් ලියකම් හා කුරුල්ලන්ගේ රූප මෙන් ම මානව රූප ද සිතුවම් සඳහා යොදාගෙන ඇත. සිවිලිමේ මැද කොටසක ඇඳ ඇති ඇත් පොරය දක්වන සිතුවම් ද උසස් අලංකෘත සිතුවමකි. අංක 02 දරන ලෙනෙහි සිවිලිම සැරසීම සඳහා අලංකාර සැරසිලි මෝස්තර යොදාගෙන ඇත. මල් ලියකම් මෝස්තර, කුරුලු රූප, පලතුරු රූප, ජ්‍යාමිතික රූප හා මිථ්‍යා රූප ඒ අතර වේ. මොනරා, ගිරවා, තාරාවා, පාත්තයා ,කොකා වැනි කුරුලු රූප ද අඹ, අන්නාසි, මිදි, පෙයාස්, දං වැනි පලතුරු රූප ද මෝසතරානුසාරයෙන් සිතුවම් කර ඇත. එමෙන් ම නෙළුම්, සපු, දිය මානෙල් වැනි මල් මෝස්තර ද ඒ අතර වේ. අජන්තාවේ සිවිලිම් මෝස්තර අතරින් අලංකාර සිවිලිම් මෝස්තරයක් මෙහි දක්නට ඇත. ආලින්දය, ප්‍රධාන ශාලාව, අන්තරාලය මෙන් ම ඇතුළ කුටිවල ද සිවිලිම් මෝස්තර වේ. මේවායේ වියන්තල රවුම් ආකාරයට සිතුවම් කර ඇත. එහි මැද නෙළුම් මල් මෝස්තරයකි. එහි වූ රවුම් තීරුවල මල් මෝස්තර වෙයි. චතුරාස්‍රාකාර ස්වරූපයක් ගන්නා සිවිලිමේ රවුමට වෙන් වූ කොටස හැර ඉතිරි ත්‍රිකෝණාකාර කොන් හතරෙහි මිථුන රූප චිත්‍රණය කර තිබීම දැකිය හැකි ය. මේ ලෙනෙහි සම්පූර්ණයෙන් ම වියන්තල සරසා ඇත්තේ වෘත්තාකාර ස්වරූපවලිනි. සමස්තයක් ලෙස ගත් කල මේ චිත්‍ර විද්වත් කලා සම්ප්‍රදායයක ලක්ෂණ පළ කරයි. අජන්තා ශිල්පියා සතු ව තිබූ පිරිපුන් දැනුම, නිර්මාණ කෞශල්‍ය හා රසිකත්වය චිත්‍රවලින් මැනවින් පිළිබිඹු වේ.

**ප්‍රමුඛ පදඃ** අජන්තා ලෙන්, සිතුවම් ශෛලිය, ආකෘතික ලක්ෂණ, මෝස්තර, ගෘහ නිර්මාණ ශිල්පය

[1]දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසංගික කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය